# රස පෙරත

# සැපදිල්ලා

'ඇකරස් සැපොටා' යන උද්භිද නාමයෙන් හඳුන්වන සැපදිල්ලා මිහිරි රසයෙන් යුක්ත පලතුරු වර්ගයකි.

මනා ජල වහනයකින් යුක්ත වැලි මිශ්‍ර ලෝම පස වගාවට ඉතාමත් යෝග්‍ය වුවත් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සැ ප දි ල් ලා පහසුවෙන් වගා කළ හැක.

සැපදිල්ලා ක්‍රම තුනකට ප්‍රචාරනය කළ හැක. බීජ මගින්, ලෙයර් කිරීමෙන් හා බද්ධ පැල මගින්වේ, බීජ මගින් පැල කිරීම ලෙහෙසි වුවත්, පලදාව ලබා ගැනීමට කලක් ගතවේ. බීජ සිටුවා අවුරුදු එකකින් පමණ පැල ස්ථිර බිමේ සිටුවීමට යෝග්‍ය වේ. ලෙයර් කිරීම මෙන්ම බද්ධ කිරීමේ ක්‍රම මගින් ලබා ගත් පැළ සිටුවීමෙන් අවුරුදු 2—3 පමණ පල ලබා ගත හැක.

මනාව සකස් කර ගත් ස්ථිර භූමියේ බද්ධ පැල සඳහා පරතරය අඩි 20X20 ක්ද, බීජ පැල සඳහා අඩි 30X30 ක්ද. සිටින සේ අඩි 2X2X2 පරිමානයට කපාගත් වල වල් යෝග්‍යයි. කොම්පෝස්ට පොහොර මතුපිට පස හා මිශ්‍ර කිරීමෙන් පසුව පැල සිටුවන්න. වියලි කාලගුණයක් පවතී නම් පැළවලට සෙවනක් මෙන්ම ජලයද සැපයිය යුතුය.

විල්පැල මර්ධනය කර පස බුරුල් කර වර්ෂයකට දෙවරක් බැගින් පොහොර යෙදීමෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැක.

බීජ පැල සිටුවා අවුරුදු 8ක් 9 කින්ද බද්ධ පැල වලින් අවුරුදු 3ක් 4 කින්ද පල හට ගනී. වර්ෂය මුළුල්ලේම පලදාව ලැබුනත් ජූලි, සැප්තැම්බර් මාසවල දී වැඩිපුර පලදාවක් ලැබේ. සාමාන්‍ය ගසකින් වසරකට ගෙඩි 400-600 ක පමණ අස්වැන්නක් නෙලා ගත හැක.